PR/2019/11S

# ජපන් තානාපති කාර්යාලය

නො 20, ශ්‍රීමත් ආර්.ජී.සේනානායක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව
දු.ක :94-11-269-3831~3, ෆැක්ස් 94-11-269-8629
ඊ මේල්: cultujpn@sltnet.lk

මාර්තු 06, 2019

## පුවත්පත් නිවේදනය

### 2019 මාර්තු 2 වන දින නිදහස් චතුරශ්‍ර ආර්කේඩ් පරිශ්‍රයේදී පැවැත්වූ ජපන් සංස්කෘතික උළෙල

ශ්‍රී ලංකාවේ ජපන් තානාපති කාර්යාලය, ජපන් සහයෝගිතා සංගමය සහ ජපන් වානිජ හා වෙළඳ සංගමය සමග ඒකාබද්ධව ඉදිරිපත් කල ජපන් සංස්කෘතික උළෙල 2019 මාර්තු 2 වන සෙනසුරාදා දින කොළඹ 7 නිදහස් චතුරශ්‍ර ආර්කේඩ් පරිශ්‍රයේදී පැවැත්විණ.

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික අමාත්‍ය ගරු සජිත් ප්‍රේමදාස මහතා ප්‍රධාන ආරාධිත වශයෙන් සහභාගී වූ 25 වන බුන්කා සම්මාන ප්‍රදානෝත්සවය -2019 ද, මෙම උළෙල අතරවාරයේදී සිදු කෙරිණ.

ශ්‍රී ලංකාව සහ ජපානයේ සංස්කෘති සහ කලාවන් අතර අන්‍යොන්‍ය අවබෝධය නගා සිටුවීම ඔස්සේ දෙරට අතර මිත්‍රත්වය වර්ධනය කිරීමට දායක වන ජපන් ශ්‍රී ලංකා මිත්‍රත්ව සංස්කෘතික අරමුදල විසින් 1993 දී බුන්කා සම්මාන ස්ථාපනය කරන ලදී.

කලා ක්ෂේත්‍රයේ විශිෂ්ට දක්ෂතා දැක්වූ පහත සදහන් කලාකරුවන් සහ කලාකාරිනියන් පස් දෙනා වෙත මෙම ගෞරවාන්විත සම්මානය මෙවර තිළිණ කෙරිණි.

1. ආචාර්ය ඉන්දික ෆර්ඩිනැන්ඩු: නාට්‍ය, චිත්‍රපට ( අධ්‍යක්ෂක)
2. ලීලාවතී සෙල්වරාජ් මෙය: නාට්‍ය (රංගන ශිල්පිනී, අධ්‍යක්ෂිකා,නර්ථන නිර්මාණ ශිල්පිනී)
3. අනුජ මදුසංඛ ද සිල්වා: දෘශ්‍ය ප්‍රයෝග සහ ග්‍රැෆික් නිර්මාණ
4. තජිතාන්ගනී ඩයස් මෙය: නර්තන ශිල්පිනී ( උඩරට)
5. ආචාර්ය ප්‍රියන්ත උඩගෙදර: චිත්‍ර සහ දෘශ්‍ය කලාව

සම්මාන ප්‍රදානෝත්සවයට අනතුරුව පැවැත්වූ ජපන් සංස්කෘතික ප්‍රදර්ශනය, සාම්ප්‍රදායික සටන් කලාව සහ ජපන් පොප් සංගීතය කොස් ප්ලේ දැක්මත්, **"ස්පිරිටඩ් අවේ - සෙන් තො චිහිරො නො කමිකකුෂි"** (**Spirited Away-Sen to Chihiro no Kamikakushi**) සජීවීකරණ චිත්‍රපටය සමග සුසංයෝජනය විය.

ශ්‍රී ලංකා සහ ජපන් සංස්කෘතික අංග වල සමෘද්ධිමත්භාවය, රසාස්වාදය කිරීමට මෙම සුවදායක සැන්දෑවේදී උළෙල නැරඹීමට පැමිණි දහසකට අධික වූ රසිකයන් හට හැකිවිය.

**************************************************************

වැඩි විස්තර සදහා සංස්කෘතික අංශය අමතන්න
දු.ක :94-11-269-3831~3 ( දිගුව- 223)